# කොවිඩ් 19 - සති පාසල - සබරගමු පළාත - නිවිතිගල අධ්‍යාපන කලාපය

9 ශ්‍රේණිය - ඉතිහාසය -දෙවන වාරය - පලමු සතිය

ඒකක - 03 - ශ්‍රී ලංකා ආගමික හා ජතික පුනර්ජීවනය

පැවරුම් අංක - 01

- ක්‍රියාකාරකම - (අංක -01) - ශ්‍රී ලංකාවේ ආගමික පුනරුදයක් ඇතිවීම පසුබිම හදුනාගනිමු.
- ගුණාත්මක යෙදවුම් - 9 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොත / ඉතිහාසය සටහන් පොත් A 4 CRකොළ පෑන් /පැන්සල්

ක්‍රියාකාරකම් සඳහා සිසුන්ට උපදෙස් -

- පියවර 1 - ඉතිහාසය පෙළ පොතෙහි ඒකකය 03 ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීව නය යන පාඩම ශබ්දනගා අවස්තා දෙකක් කියවන්න.
- පියවර 2 – (පෙළ පොත් පිටු අංක 53 සිට 56 දක්වා උපකාර කරගන්න)
  සපයාගත් A4/CR කඩදාසියෙහි පහතින් ලබාදී ඇති තේමා ( මාතෘකා) සම්බන්ධයෙන් තොරතුරු රැස්කරන්න.

  ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය තහවුරු කරගත් යුරෝපීය ජාතීන්

  එම ජාතීන්ට අයත් ප්‍රධාන ආගම හා එහි ප්‍රධාන නිකායන් දෙක.

යුරෝපීයන් පෙරදිගට පැමිණීමේ ප්‍රධාන අරමුණු තුනකි එනම්.
ආගම ව්‍යාප්ත කිරීම , ආර්ථික බලය ලබාගැනීම,දේශපාලය බලය ව්‍යාප්තකිරීම,
ඔවුන් ආගම ව්‍යාප්ත කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග පොදුවේ මිෂනාරී ව්‍යාපාර ලෙසත් හදුන්වයි.

ලංකාවට පැමිණි මිෂනාරී සංවිධාන / එම සංවිධාන ආගම ව්‍යාප්ත කිරීමට ගත් ක්‍රියාමාර්ග/ එම ක්‍රියාමාර්ග සාර්ථක වීමට හේතු සාධක .

- ඉහත මාතෘකා යටතේ තොරතුරු ගොනුව සකස් කරන්න.
- පියවර 03 - ඔබගේ සටහන් පොතෙහි පාඩමේ මාතෘකා ලියාගන්න.
  පසුව පහතින් සපයා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න . (පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය සටහන් පොතෙහි ලිවීම අනිවාර්ය වේ.)

ප්‍රශ්නාවලිය - (1)ආගමික පුනර්ජීවනය යනු (2) මිෂනාරී ව්‍යාපාරය යනු (3)19 වන සියවසේ මෙරටට පැමිණි මිෂනාරී සංවිධාන ලියාදක්වන්න ( 4) මිෂනාරිවරුන් ආගම ව්‍යාප්ත කිරීමටගත් ක්‍රියාමාර්ග දක්වා ඒවා විස්තර කරන්න.

(5)මිෂනාරී කටයුතු සාර්ථකවීමට බලපෑ හේතුසාධක ලියාදක්වන්න.

(6)මිෂනාරී කටයුතුනිසා තර්ජනයට ලක් ස්වදේශිය අගම් 3 ලියා දක්වන්න.